# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,520 — 2007 ඔක්තෝබර් මස 19 වැනි සිකුරාදා — 2007.10.19

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1170 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1170 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පලකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ඔක්තෝබර් මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ඔක්තෝබර් මස 12 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාල සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරීහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

## විභාගාපේක්ෂකයන් සඳහා නීති හා උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කල යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක වක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුර - මහනුවර දිස්ත්‍රික්කය

### අවලංගු කිරීම

ම විසින් පළකරන ලද මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් කොට්ඨාසයේ විවාහ, උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනවල සඳහන් අයදුම්පත් කැඳවීම, නව බඳවා ගැනීමේ පරිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් අවලංගු කරමි.

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳ වූ කොට්ඨාසය සහ තනතුර* | *ගැසට් පත්‍රයේ අංකය සහ දිනය* |
|---|---|---|---|
| මහනුවර | පාතදුම්බර | පල්ලේගම්පහ නැගෙනහිර, උප්පැන්න, මරණ සහ පාතදුම්බර විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1400 සහ 2005.07.01 |

10–477

---

## සංශෝධනය

### කුසලතාවය හා ජ්‍යෙෂ්ඨතාවය මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I පන්තියට උසස් කිරීම – 2007

අංක 1514 දරන හා 2007 සැප්තැම්බර් මස 07 වැනි දින ඉහත සඳහන් කාරණය සම්බන්ධව පළ කල *ගැසට් නිවේදනයේ* සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2007 ඔක්තෝබර් මස 26 වෙනි දින දක්වා දීර්ඝ කළ බව මෙයින් දන්වා සිටිමි.

ආරියරත්න හේවගේ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 04 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

10–690

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## නිවැරදි කිරීමයි

### විදේශ කටයුතු අමාත්‍යාංශය

2007 ඔක්තෝබර් 12 වැනි දින අංක 1519 දරන *ගැසට් පත්‍රයේ* ඉහත ශීර්ෂය යටතේ පලකරන ලද නිවේදනයේ දෙවැනි ශීර්ෂය වශයෙන් පළවූ "ශ්‍රී ලංකා විදේශ සේවයේ II වන ශ්‍රේණියට බඳවා ගැනීමෙ විවෘත තරග විභාගය - 2007" යන්න "ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමෙ විවෘත තරග විභාගය - 2007" යනුවෙන් නිවැරදි විය යුතුය.

පාලිත ටී. බී. කොහොන,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් 12 වැනි දින.

---

## වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II'ආ' ඛණ්ඩයේ වැඩ පරිපාලක තනතුරු

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ 'ආ' ඛණ්ඩයේ වැඩ පරිපාලක තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2007.11.30 වැනි දින හෝ ඊට පෙරාතුව ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 07, අංක 230, බෞද්ධාලෝක මාවතේ, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ එවිය යුතුය.

අයදුම්පත බහාලන ලියුම් කවරයේ උඩ වම්පස කෙළවරේ "වැඩ පරිපාලක තනතුරු" යනුවෙන් සඳහන් කළ යුතුය.

මෙම දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. *වැටුප් ක්‍රමය.–* පුහුණුවීම් කාලය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු මෙම තනතුර සඳහා මාසික ඒකාබද්ධ වැටුප් පරිමාණය රුපියල් 14,140 - 10 x 140 - 11 x 150 - 6 x 210 - 14 x 290 - රු. 22,510 වේ. (තුන්වන වාර්ෂික වැටුප් පියවරට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය.)

පුහුණු කාලය තුළදී මාසිකව රු. 12,920 - 1 x 120 - රු. 13,040 ගෙවනු ලැබේ.

4. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

(අ) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු අතර මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතුය.

(ආ) 2007.11.30 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (පළාත් හා රාජ්‍ය සේවයෙහි නියුතු සේවකයින් කෙරෙහි උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

p (ඇ) මනා චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) (I) *බාහිර අයදුම්කරුවන් සඳහා.–*

I.I පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සඳහා මූලික අධ්‍යාපන සුදුසුකම් වශයෙන් ශුද්ධ ගණිතය/ව්‍යවහාර ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ. පො. ස. (උ. පෙළ) විභාගය එකවර සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් හයකින් අ. පො. ස. (සා.පෙ.) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම ; හෝ

I.II ඉහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ක්ෂේත්‍රයට අදාල ජාතික තාක්ෂණ සහතිකය (තුන් අවුරුදු අර්ධ කාලීන පුහුණු පාඨමාලාව) හෝ සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබීම.

(II) *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා.-*

භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය හා විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ. පො. ස (සා.පෙ.) විභාගය විෂයයන් හයකින් සමත්වීම සමඟ අදාල ක්ෂේත්‍රයේ වසර දහයක (10) පළපුරුද්ද ලබා ඇති අය ; හෝ

ඉහත I.IIහි සඳහන් තාක්ෂණික සුදුසුකම් සමඟ අදාල ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්ද ලබා ඇති දෙපාර්තමේන්තු සේවකයින් අතුරින් දෙපාර්තමේන්තු පරීක්ෂණයක ප්‍රතිඵල මත පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කෙරේ. මේ සඳහා තෝරාගනු ලබන්නේ යටත් පිරිසෙයින් පුහුණු කම්කරු ශ්‍රේණිවල I වැනි පන්තියේ II ශ්‍රේණියේ වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අය අතුරිනි.

*සටහන.-* විවෘත තරඟ විභාගයෙන් තාක්ෂණ සේවයේ පුහුණු ශ්‍රේණියකට සුදුසුකම් ලබන එනම් -

(i) 4(ඈ) 1.1 ඡේදයේ සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සේවයට අදාළ විෂය නිර්දේශය අනුව ලබාගන්නා දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිමකොට අදාල විභාගය සමත්වීමෙන් පසු II පන්තිය "ආ" ඛණ්ඩයට පත් කරනු ලැබේ.

(ii) 4(ඈ) I.II ඡේදයේ සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සේවයට අදාළ විෂය නිර්දේශය අනුව ලබාගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිමකොට අදාල විභාගය සමත්වීමෙන් පසු II පන්තිය "ආ" ඛණ්ඩයට පත් කරනු ලැබේ.

(iii) දෙවසරකට වඩා වැඩි පුහුණුවක් අවශ්‍ය යම් විශේෂ සේවා වෙතොත් එම අතිරේක පුහුණු කාලසීමාවට සැලකීමක් වශයෙන් අතිරේක පුහුණු එක් වසරක් වෙනුවෙන් එක් වැටුප් වර්ධකයක් බැගින් ලබාදීමේ පදනම මත පුහුණුව අවසානයේ II පන්තිය "ආ" ඛණ්ඩයට බඳවාගනු ලබන අතර, අතිරේක පුහුණු කාලසීමාව II පන්තිය "අ" ඛණ්ඩයට උසස් කිරීම සඳහා සලකා බලනු ලබන කාලසීමාවට ගණන් ගනු ලැබේ.

(iv) ඉහත (i) හා (ii) යටතේ වන පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත්, ඔවුනට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

5. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

5.1 ජනවාර්ගික අනුපාතය හා කුසලතාවය මත පදනම් වූ අංක 15/90 දරන සහ ඊට සම්බන්ධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව සහ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව පත්වීම් ලබාදෙනු ලැබේ.

5.2 (අ) බඳවාගැනීමේ පන්තිය වන II වන පන්තියේ "ආ" ඛණ්ඩයේ පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70%ක් බාහිර අයදුම්කරුවන්ගෙන් ද, 30%ක් සුදුසුකම් ලත් දෙපාර්තමේන්තු සේවකයන්ගෙන් ද, තරඟ විභාගයක ප්‍රතිඵල මත සම්පූර්ණ කෙරේ.

(ආ) එතකුදු වුවත්, 04ඈ II ඡේදයේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් දෙපාර්තමේන්තු තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මගින් ම තෝරාගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගත හැකිය.

5.3 *බාහිර අයදුම්කරුවන්.–* රජයේ ගැසට් නිවේදනයක් මගින් හා/හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධියට පත්කර අයදුම්පත් කැඳවා, සුදුසුකම් සහිත අයදුම්කරුවන් තරඟ විභාගයකට යොමුකර, එම විභාගයේ වැඩිම ලකුණු ලබාගත් අය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු නොලබන අතර සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලැබේ. සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

5.4 *අභ්‍යන්තර අයදුම්කරුවන්.-* දෙපාර්තමේන්තු නිවේදනයක් මගින් ප්‍රසිද්ධියට පත්කර අයදුම්පත් කැඳවා, සුදුසුකම් සහිත අයදුම්කරුවන් තරඟ විභාගයකට යොමුකර, එම විභාගයේ වැඩිම ලකුණු ලබාගත් අය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසු අය තෝරාගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු නොලබන අතර සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලැබේ. සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්ණ පත්‍රයට අවම වශයෙන් 35%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

*සටහන* :- (i) දෙපාර්තමේන්තු සේවකයන් අතුරෙන් දෙපාර්තමේන්තු පරීක්ෂණයක ප්‍රතිඵල මත පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරාගනු ලබන අයදුම්කරුවන් එක් අවුරුදු පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගය සමත්වීමෙන් අනතුරුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තිය "ආ" ඛණ්ඩයට ඇතුළත් කෙරේ.

(ii) මෙම නිලධාරීන් පුහුණු කිරීමේ ශ්‍රේණියේදී තමන් කලින් දැරූ වැටුප් පරිමාණයේම තවදුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වන විභාගය සමත්වන තුරු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ බඳවා ගැනීමේ ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණු ශ්‍රේණියේ සතුටුදායක ලෙස ගත කරන නිලධාරියෙකු දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේම ඉහළ වැටුප් තලයේ පිහිටුවනු ලබන අතර, දීමනාව තවදුරටත් ගෙවනු ලැබේ. විභාගය සතුටුදායක ලෙස සම්පූර්ණ කල විට 2000.03.02 දිනැති අංක 07/2000 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන්

සංශෝධිත, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව වැටුප් පරිවර්තනය කරනු ලැබේ.

(iii) අදාළ පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත්, ඔවුනට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයින් නැවත ඔවුන්ගේ පූර්ව තනතුරු වෙත මුදා හැරේ.

5.5 බාහිර අයදුම්කරුවන් හා අභ්‍යන්තර අයදුම්කරුවන් දෙපිරිසම සඳහා පවත්වනු ලබන තරග විභාගය පහත පරිදි වේ.

| *විෂයය* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 |
| 2. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය I - ගණිතය | පැය 2 1/2 | 100 |
| 3. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය II - භෞතික විද්‍යාව | පැය 2 1/2 | 100 |

6. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි*.- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතුය.

7. *සේවා කොන්දේසි* :

(i) පරිවාස කාලය අවුරුදු 03කි.

(ii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා ඡේදවල විධිවිධාන ද අදාළ වේ.

8. අයදුම්පත් පහත සඳහන් සහතිකවල පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය.

(i) අ. පො. ස. (සා.පෙළ) සහතිකය, අ. පො. ස. (උ.පෙළ) සහතිකය හා තාක්ෂණික සහතික පත්‍ර.

(ii) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන උප්පැන්න සහතිකය. (අධ්‍යාපන සංග්‍රහයේ පරමාර්ථ සඳහා නිකුත් කරනු ලබන බෞතිස්ම කිරීමේ සහතිකය පිළිගනු නොලැබේ.)

(iii) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්. (මින් එක් සහතිකයක් අවසන්වරට ඉගෙනගත් පාසලේ හෝ විද්‍යාලයේ විදුහල්පතිගෙන් සහ තවත් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් විය යුතුය.)

*සටහන*.– ඉහත සඳහන් සහතිකවල පිටපත් ආපසු දෙනු නොලැබේ.

9. රජයේ, පළාත් හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මගින් එවිය යුතුය.

10. සියලුම අයදුම්කරුවන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ස්ථානයකදී පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකට සහ සම්මුඛ පරීක්ෂණයකට තමන්ගේම වියදමෙන් පුද්ගලිකවම සහභාගි විය යුතුය.

11. සේවය අවශ්‍යවන ඕනෑම අවස්ථාවකදී දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීම සඳහා බැඳී සිටිය යුතුය. තෝරාගන්නා ලද අයදුම්කරුවන් විශේෂයෙන්ම දැනට නව ව්‍යාපෘති සඳහා යෝජිත දුෂ්කර ප්‍රදේශවලට අනුයුක්ත කරනු ලබන අතර එම ස්ථානවල අවම වශයෙන් අවුරුදු 5ක් සේවය කළ යුතුය.

12. අයදුම්පතේ සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව, තෝරාගැනීමට පෙර සොයාගනු ලැබුවහොත් අයදුම්පත්‍රය අවලංගු කරනු ලැබේ. පත් කිරීමෙන් පසුව වරද අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබේ.

13. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම්වලට අදාළ II(අ) වැනි ඡේදයේ I වැනි කොටසට අදාල පොදු කොන්දේසි හා අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් කෙරෙහි අවධානය යොමු කෙරේ.

14. මෙම කොන්දේසිවලින් අනාවරණය නොවූ කරුණු සම්බන්ධයෙන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කෙරෙන පරිදි කටයුතු කෙරෙනු ඇත.

ඉංජි. බී. එම්. එස්. සමරසේකර,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2007 සැප්තැම්බර් මස 28 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
අංක 230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.
දුරකථන අංකය : 2584984,
ෆැක්ස් අංකය : 2505890.

ආදර්ශ අයදුම්පත්‍රය

*වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය*

*වාරිමාර්ග දෙපාර්තමේන්තුව*

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II "ආ" ඛණ්ඩයේ වැඩ පරිපාලක තනතුර

01. (අ) සම්පූර්ණ නම :—————.

(ආ) මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

02. (අ) තැපැල් ලිපිනය (ඉංග්‍රීසියෙන්) :—————.

(ආ) ස්ථිර පදිංචි ලිපිනය :—————.

03. පදිංචි දිස්ත්‍රික්කය :—————.

04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම :—————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

06. විභාගයට ඉදිරිපත් වන මාධ්‍යය :

සිංහල ☐ දෙමළ ☐

07. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න) :

(අ) අවුරුද්ද :—————, මාසය :—————, දිනය :—————.

(ආ) උපන් ස්ථානය :—————.

(ඇ) 2007.11.30 වැනි දිනට වයස :

අවුරුදු :—————, මාස :—————, දින :—————.

08. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

09. දුරකථන අංකය :

කාර්යාලයීය :—————. නිවස :—————. ජංගම :—————.

10. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද ? ඔව්/නැත :

ජාතිය :

| | | | | | |
|---|---|---|---|---|---|
| සිංහල | ☐ | මුස්ලිම් | ☐ | වෙනත් | ☐ |
| ශ්‍රී ලංකා ද්‍රවිඩ | ☐ | බර්ගර් | ☐ | | |
| ඉන්දියානු ද්‍රවිඩ | ☐ | මැලේ | ☐ | | |

11. අධ්‍යාපනික සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණන්න) :

(i) අ. පො. ස. (සා. පෙළ) විභාගය :
අවුරුද්ද :——————.
විභාග අංකය :——————.
විෂයයන් (සාමාන්‍ය, සම්මාන, අධි සම්මාන හෝ විශිෂ්ඨ සම්මාන යන බව සඳහන් කරන්න.)

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

විශිෂ්ඨ සම්මාන :——————.
අධි සම්මාන :——————.
සම්මාන :——————.
සාමාන්‍ය සාමාර්ථ :——————.
එකතුව :——————.

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගය :
අවුරුද්ද :——————.
විභාග අංකය :——————.
විෂයයන් (සාමාන්‍ය, සම්මාන, අධි සම්මාන හෝ විශිෂ්ඨ සම්මාන යන බව සඳහන් කරන්න.) :

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

12. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1,094/2 හා 1999.08.23 දින දරන ගැසට් පත්‍රයේ සඳහන් පරිදි උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද ආයතනයකින් ලබාගත් තාක්ෂණ සුදුසුකම්. (කරුණාකර පාඨමාලාවේ හා ආයතනයේ නම සඳහන් කරන්න.) (සහතිකවල පිටපත් අමුණන්න) :——————.

13. අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද :

| ආයතනය | තනතුර | සේවා කාලය |
|---|---|---|
| i. | | |
| ii. | | |

14. රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක සේවය කොට සේවය අතහැර ගියේ ද/අස්වූයේ ද/සේවය නතර කරනු ලැබුවේ ද/සේවයෙන් පහකරනු ලැබුවේ ද/ එසේනම් ඊට හේතු :——————.

15. ඔබ දැනට රැකියාවක යෙදී ඇත්නම් ඒ පිළිබඳ විස්තර :
(අ) තනතුර :——————.
(ආ) ආයතනය :——————.
(ඇ) පත්වීම් ලද දිනය :——————.
(ඈ) පත්වීමේ ස්වභාවය :——————.
(ඉ) ඔබ දැනටමත් රජයේ සේවයේ යෙදී සිටිනම් ඔබේ සේවය සතුටුදායක ද ? :——————.

16. සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකින් වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර :——————.

17. චරිත සහතික ලබාගන්නා තිදෙනාගේ නම්, පදවි හා ලිපිනයන් :———.

18. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව හෝ තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු එවැනි දෑ අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දෙපාර්තමේන්තු/සංස්ථා/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය*

.................. මයා./මිය./මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/ආයතනයේ සේවයේ නියුතු බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද, මෙම තනතුරට අදාළ නිවේදනයේ දැක්වෙන පරිදි මෙම තනතුරට අයදුම් කිරීමට සුදුසුකම් සපුරන බව ද, ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි.

——————,
දෙපාර්තමේන්තු/සංස්ථා/ආයතන ප්‍රධානියාගේ
බලයලත් නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව).

නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.
දිනය :——————.

10–561

---

## වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය

## ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

## ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව

### *ආධුනිකයන් බඳවාගැනීම - 2008 ජනවාරි*

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන ආධුනිකත්ව අභ්‍යාස ආයතනය පහත දැක්වෙන පූර්ණ කාලීන පාඨමාලා හැදෑරීම සඳහා ශ්‍රී ලාංකීය තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *පවත්වනු ලබන පූර්ණ කාලීන පාඨමාලා* :

| *පාඨමාලාවේ නම* | *(නිපුණතා පාදක පුහුණුව)* | *කාලය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01 කම්බි නැවුම් ශිල්පී | 3 වන මට්ටම | මාස 06 | අ. පො. ස. (සා. පෙළ) දක්වා |
| 02 ගොඩනැගිලි පින්තාරු ශිල්පී | - | අවු. 01 | |
| 03 පෙදරේරු කාර්මික ශිල්පී | 4 වන මට්ටම | අවු. 02 | |
| 04 ජලනල කාර්මික ශිල්පී | 4 වන මට්ටම | අවු. 02 | |
| 05 ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) | 4 වන මට්ටම | අවු. 02 | |
| 06 ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පී | 3 වන මට්ටම | අවු. 02 | දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම |
| 07. පැස්සුම් ශිල්පී | 4 වන මට්ටම | අවු. 03 | |
| 08. ආවුද සහ අච්චු තැනුම් ශිල්පී | 4 වන මට්ටම | අවු. 03 | |
| 09. ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 2 වන මට්ටම | අවු. 02 | |
| 10. පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පි | 4 වන මට්ටම | අවු. 02 | දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම සහ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම |
| 11. පරිගණක යෙදවුම් සහායක | 3 වන මට්ටම | අවු. 01 | |
| 12. යන්ත්‍රකරු (විශේෂ) | - | අවු. 03 | දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම |
| 13. විදුලි කාර්මික (විශේෂ) | - | අවු. 03 | |
| 14. ඉලෙක්ට්‍රොනික් කාර්මික (විශේෂ) | - | අවු. 03 | |

*යෞවන ඔබට* :

* විදේශ රැකියා
* ස්වයං රැකියා
* රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියා සඳහා ලොව පිළිගත් විධිමත් පුහුණු සහතිකයක්.

*අයදුම්පත්* :

* 2007.10.19 දින *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙන්,*
* මොරටුව ආධුනිකත්ව අභ්‍යාස ආයතනයෙන්,
* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියෙන්,
* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ පළාත් කාර්යාල සහ පුහුණු මධ්‍යස්ථානවලින්.

*සැ. යු.*- ලැබෙන අයදුම්පත් සලකා බලා ඉල්ලුම්කරුවන්ට ගැලපෙන පාඨමාලාව තෝරාදීමට ලිඛිත පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරනු ඇත. ඊට අමතරව අධ්‍යාපන සුදුසුකම් ද විශේෂයෙන් සලකා බලනු ලැබේ.

*වයස*.– 2008.01.01 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු 35ට නොවැඩි විය යුතුය.

3. *පුහුණුව පිළිබඳ විස්තර*.– සියලුම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැළසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේ දී මූලික පුහුණුව ආයතනය තුළදී ලබාදේ. එම කාලය තුළ මාසික දීමනාවක් ආධුනිකයාට ලබාදේ. පුහුණුවේ දෙවන භාගයේ දී වැඩිපුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ. පෙදරේරු කාර්මික ශිල්පී, ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) හා පැස්සුම් ශිල්පී වැනි කාර්මික ශිල්ප සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් අතිශයින් වැඩි වී ඇත. පැස්සුම් ශිල්පී පාඨමාලාවේ දී පහත සඳහන් නවීන පැස්සුම් ශිල්පී ක්‍රම ද පුහුණු කරනු ලැබේ. (MMS/GAS/TIG/MIG/MAG/PLASMA).

4. *ආධුනිකත්ව ගිවිසුම*.– තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම ආධුනිකයා සහ සේවායෝජකයා යන දෙදෙනා වෙත අන්‍යොන්‍ය වගකීම පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතුය. පාඨමාලාවෙහි මුල් මාස 06 ආධුනිකයාගේ පරිවාස කාලය ලෙස සැලකේ. සතුටුදායක ලෙස පරිවාස කාලය අවසන් කිරීමට අපොහොසත් වුවහොත් ආධුනිකයාගේ ආධුනිකත්වය අවලංගු කරනු ලැබේ. හදාරනු ලබන පාඨමාලාව අනුව නිපුණ කාර්මික (විශේෂ) හෝ NVQ සහතිකය පුහුණුවෙන් පසු ලබාගත හැකිය.

5. *තෝරාගැනීමේ ක්‍රමය* :–

5.1 සියළුම අයදුම්කරුවන් පැය 01ක් වූ ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකට කැඳවනු ලැබේ. මේ සඳහා රු. 100ක මුදලක් අය කරනු ලබන අතර ඒ පිළිබඳ වැඩි විස්තර පසුව දැනුම් දෙනු ලැබේ.

මෙම ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා එහිදී ලබාගන්නා ලකුණු මත පාඨමාලාව තෝරා දෙනු ලැබේ. සියලුම පාඨමාලාවන් දේශීය/විදේශීය රැකියා අවස්ථා ඇති සම මට්ටමේ උසස් පාඨමාලාවන් බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

5.2 පාඨමාලා සඳහා බඳවාගනු ලබන සියලුම අයදුම්කරුවන් තමාගේ පුහුණු කාලය අනුව පහත සඳහන් පරිදි ආයතනයට මුදල් ගෙවිය යුතුය.

| *පාඨමාලා කාලය* | *මාස 06 රු.* | *අවුරුදු 01 රු.* | *අවුරුදු 02 රු.* | *අවුරුදු 03 රු.* | *පරිගණක අවුරුදු 01 රු.* |
|---|---|---|---|---|---|
| පාඨමාලා ගාස්තුව | නැත | නැත | නැත | නැත | 3,000 0 |
| ගුරු දෙගුරු සංගමයට | 100 0 | 150 0 | 250 0 | 350 0 | 150 0 |
| රක්ෂණ අරමුදලට | 200 0 | 400 0 | 800 0 | 1,200 0 | 400 0 |
| පොත් සඳහා | 50 0 | 50 0 | 50 0 | 50 0 | 50 0 |
| එකතුව | 350 0 | 600 0 | 1,100 0 | 1,600 0 | 3,600 0 |

5.3 ඉහත සඳහන් සුදුසුකම් සපුරන අයදුම්කරුවන් පමණක් පාඨමාලාවට බඳවාගනු ලැබේ.

6. *අයදුම්පත් එවිය යුතු ආකාරය* :–

6.1 ඔබේ නම හා ලිපිනය ලියූ මුද්දර කවරයක් මෙම ආයතනයට එවීමෙන් හෝ ආයතනයට පැමිණීමෙන් හෝ ඉල්ලුම්පතක් ඔබට ලබාගත හැකිය. නැතිනම් දක්වා ඇති ආකෘතියට අනුව, "11 1/2 x 8 1/4" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ ඉල්ලුම් පතක් එවිය හැකිය. ඔබගේ ඉල්ලුම්පත සමඟ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් 2007 නොවැම්බර් මස 09 වැනි දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට යොමුකළ යුතුය.

අධ්‍යක්ෂ/විදුහල්පති,
ආධුනිකත්ව අභ්‍යාස ආයතනය,
අංක 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.

6.2 එක් අයදුම්කරුවෙකු තමන් කැමති පාඨමාලා තුනක නම් අනුපිළිවෙලින් ඉල්ලුම්පතේ සඳහන් කළ යුතුය.

6.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරූ අයට හෝ දැනට හදාරන අයට මේ සඳහා අයදුම්කළ නොහැක.

6.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ආධුනිකයන් බඳවාගැනීම 2008 ජනවාරි" යන්න සඳහන් කළ යුතුය.

7. තැපෑලේ දී නැතිවන හා ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් ආධුනිකත්ව අභ්‍යාස ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

*ආදර්ශ අයදුම්පත්‍රය (11 1/2" × 8 1/4" (A4) ප්‍රමාණයේ)*

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

*ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව*

**ආධුනිකයන් බඳවාගැනීම - 2008 ජනවාරි**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————. මයා./මිය./මෙනෙවිය
2. මුලකුරු සමග නම :————.
3. ලිපිනය :————.
4. පදිංචිය (i) ග්‍රාම සේවා වසම :————.
   (ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
   (iii) ඡන්ද කොට්ඨාසය :————.
   (iv) දිස්ත්‍රික්කය :————.
5. දුරකථන අංකය :————.
6. උපන් දිනය :————.
7. ජාතික හැඳුනුම්පත් අංකය :————.
8. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :————.

අ. පො. ස. (සා.පෙළ) ප්‍රතිඵල :-

| *විභාග අංකය* | *වර්ෂය* |
|---|---|
| ———— | ———— |
| ———— | ———— |

| *විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|
| | | |

9. ඔබගේ සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් අනුපිළිවෙලින් සඳහන් කරන්න :-

1. ————.
2. ————.
3. ————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බවට සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
ජාතික ආධුනිකත්ව සහ
කාර්මික පුහුණුකිරීම් අධිකාරිය.

10-639

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ඉස්ලාම් ආගමික අහදිය්‍යා අල් කුර්ආන් පාසල් සඳහා වූ අවසන් සහතික පත්‍ර විභාගය - 2007

(බෞද්ධ දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය හා සමාන විභාගයකි)

*නීති රීති හා ව්‍යවස්ථා* :

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ඉහත සඳහන් විභාගය, 2008 පෙබරවාරි මාසය තුළ පැවැත්වීමට කටයුතු යොදා ඇත. එම විභාගය සඳහා වූ විෂය නිර්දේශ ඇමුණුම 01හි සඳහන් වේ.

2. *විභාග මධ්‍යස්ථාන*.– එක් එක් දිස්ත්‍රික්කයෙන් පෙනී සිටීමට නියමිත අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව ඇමුණුම 02 හි සඳහන් නගරවල විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ.

එහෙත් යම්කිසි විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථාන අවලංගු කර එම අයදුම්කරුවන් ඊට ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ.

3. *භාෂා මාධ්‍යය*.– මෙම විභාගය දෙමළ, සිංහල, ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

4. *සුදුසුකම්*.– මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ සම්පූර්ණ කර තිබිය යුතුය.

4.1 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද අහදිය්‍යා දහම් පාසලක 10 වෙනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන අයෙකු වීම ; හෝ

4.2 මුස්ලිම් ආගමික හෝ සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද අල්කුර් ආන් මද්රසා විෂය නිර්දේශය සම්පූර්ණ කරන ලද අයෙකු වීම ;

හෝ

4.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉස්ලාම්, අරාබි විෂයයන්ගෙන් සාමාර්ථය ලත් අයෙකු වීම.

*සටහන* :-

1. මෙම විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙකුම ඉහත 4 වන ඡේදයේ සඳහන් කර ඇති සුදුසුකම් ලබා ඇති බවට අහදිය්‍යා දහම් පාසලේ විදුහල්පති හෝ අල්කුර් ආන් මද්රසාවේ ජ්‍යෙෂ්ඨ විදුහල්පති හෝ පාසලේ විදුහල්පති හෝ සහතික කළ යුතුවේ.

2. සෑම අයදුම්කරුවෙකුම මෙම විභාගයට ලියාපදිංචි කළ අහදිය්‍යා පාසල හෝ ජ්‍යෙෂ්ඨ අල් කුර්ආන් මද්රසාවේ හෝ පාසලේ විදුහල්පති හෝ මගින් පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

5. ලියාපදිංචි කළ සියලුම අහදිය්‍යා දහම් පාසල්, මද්රසා පාසල් ආදියට ඉල්ලුම්පත් හා උපදෙස් පත්‍රිකා තැපැල් මගින් යවා ඇති අතර, එසේ නොලැබුණු ආයතන වෙතොත් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට අයදුම්කරුවන් සංඛ්‍යාව සඳහන් කර ලිපියක් 2007.11.02 දිනට පෙර එවීමෙන් අයදුම්පත්‍ර සහ උපදෙස් පත්‍රිකා ලබාගත හැක.

5.1 සියලුම ඉල්ලුම්පත් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුල් පිටපත විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු අතර, අනෙක් පිටපත අදාළ ආයතනයේ ගොනු කර තැබිය යුතුය.

5.2 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනය 2007.10.16 දින වේ.

5.3 ඉල්ලුම්පත් පැහැදිලිව හා නිවැරදිව සම්පූර්ණ කළ යුතුවේ. එසේ නොවන ඉල්ලුම්පත් හා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුවේ :

විභාග කොමසාරිස් ජනරාල්,
(සංවිධාන හා විදේශ විභාග ශාඛාව),
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
(ඉල්ලුම්පත් ලැබුණු බව දැනුම් දෙනු නොලැබේ.)

5.5 ඉල්ලුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ඉස්ලාම් ආගමික අහදිය්‍යා අවසාන සහතික විභාගය - 2007" යනුවෙන් හා ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය ද සඳහන් කළ යුතුය.

5.6 ඉල්ලුම්පත්‍ර සමග කිසිදු සහතිකයක් අමුණා එවිය යුතු නැත. අහදිය්‍යා දහම් පාසලේ හෝ මද්රසාවේ විදුහල්පති හෝ පාසලේ විදුහල්පති හෝ ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය නියමිත සුදුසුකම් ලබා ඇති බව සහතික කළ යුතුය.

6. පළමුවරට මෙම විභාගයට පෙනී සිටින අයගෙන් විභාග ගාස්තු අයකරනු නොලැබේ. පළමුවරට පසු පෙනී සිටින අයදුම්කරුවන් විභාග ගාස්තු වශයෙන් රුපියල් 60ක් ගෙවිය යුතුය.

*විභාග ගාස්තු ගෙවන ආකාරය* - නියමිත මුදල තැපැල් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුය. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

7. *ප්‍රවේශ පත්‍ර*.– විභාග කොමසාරිස් ජනරාල් විසින් අදාළ අහදිය්‍යා විදුහල්පති වෙත හෝ මද්රසා විදුහල්පති වෙත හෝ පාසලේ විදුහල්පති වෙත නිකුත් කරනු ලැබේ.

7.1 යම්කිසි විභාග අයදුම්කරුවෙකු විභාගයට පෙනී සිටින පළමුවන දිනයේ තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද විභාග මධ්‍යස්ථානය හැර වෙනත් මධ්‍යස්ථානයක විභාගයට පෙනී සිටීමට තැත් කළහොත් අදාළ අයදුම්කරුගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.2 ප්‍රවේශපත්‍රයේ ඇති ඉල්ලුම්කරුගේ අත්සන අහදිය්‍යා දහම් පාසලේ විදුහල්පති හෝ මද්රසා විදුහල්පති හෝ අරාබි විදුහලේ විදුහල්පති හෝ රජයේ සේවයේ යෙදී සිටින රුපියල් 2,37,060 කට වඩා වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ නිලධාරියෙකු හෝ මස්ජිද් භාර ඉමාම් යන අයගෙන් කෙනෙකු හෝ විසින් සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින හත (07) කට පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අහදිය්‍යා පාසැල්වල හෝ මද්රසා පාසල්වල විදුහල්පතිවරුන් මේ පිළිබඳව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දිය යුතුය. එවැනි සෑම අවස්ථාවකදීම පහත සඳහන් කරුණු දැනුම් දිය යුතුය :

(*අ*) විභාගයේ නම :-

(*ආ*) අහදිය්‍යා පාසල/කුර්ආන් මද්රසා/රජයේ පාසලේ නම :-

(*ඇ*) සම්පූර්ණ නම හා ලිපිනය :-

(*ඈ*) ඉල්ලුම්කළ විභාග මධ්‍යස්ථානය :-

(*ඉ*) ඉල්ලුම්පත්‍රය යැවූ තැපැල් කාර්යාලය :-

(*ඊ*) ලියාපදිංචි කළ දිනය හා අංකය :-

8. *අනන්‍යතාව තහවුරු කිරීම*.– සියලුම අයදුම්කරුවන් විභාගයට පෙනී සිටින සෑම අවස්ථාවකදීම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන ආකාරයට තමන්ගේ අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය :

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

9. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා සමත් බව සහතික කිරීම* :-

9.1 මෙම විභාගය සඳහා නියමිත විෂයයන් ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයයන් හතරෙන් ම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවක දී අදාළ විෂයය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් ඌන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් කළ දින සිට අනුගාමී වසර තුනක් (03) ඇතුළත එම ඌන සාමාර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථය සම්පූර්ණ කළ හැකිය. (මෙය 2007 වසරේ සිට බලපැවැත්වේ.)

9.2 *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම*.– විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර අදාළ ආයතන ප්‍රධානීන් වෙත තැපැල් මගින් දන්වා යවනු ලැබේ.

10. *සහතික පත්‍ර.*– විභාගයෙන් සාමාර්ථය ලබන සියලුම අයදුම්කරුවන්ට සහතික පත්‍ර නිකුත් කරනු ලැබේ.

11. *ප්‍රතිඵල නැවත සමීක්ෂණය.*– විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයක් මගින්, නියමිත ගාස්තු ගෙවා අදාළ ආයතනයේ විදුහල්පති මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. විභාග ප්‍රතිඵලවල වෙනසක් සිදු වුවහොත් පමණක් ගාස්තු ආපසු ගෙවනු ලැබේ. කවර හෝ හේතුවක් මත ඉල්ලුම්කරුට හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයකුට හෝ උත්තර පත්‍ර නිරීක්ෂණයට අවසර දෙනු නොලැබේ.

12. ඉහත සඳහන් කොන්දේසි හා උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට සියලුම අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි සඳහන් නොවූ කරුණු සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණ ගනු ලැබේ.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2007 ඔක්තෝබර් මස 05 වැනි දින,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

*ඇමුණුම 01*

### විභාග සඳහා වූ විෂයයන් හා විෂය නිර්දේශ (2004 වන වසරේ පැවැත්වෙන විභාග සඳහාය)

මෙම විභාගයට අයත් එක් එක් ප්‍රශ්න පත්‍රයක් පැය තුනක කාලයක් සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍ර වන අතර එවැනි ප්‍රශ්න පත්‍ර හතරක් විභාගයට අයත් වේ.

*පළමුවන ප්‍රශ්න පත්‍රය* :

1. අකීදා සහ ෂරීආ (ඉස්ලාම් සිද්ධාන්ත හා මූලිකාංග)

1.1 අකීදා පොදු පැහැදිලි කිරීම් (අල් ඉලාහිය්‍යාත්, අන්නුබුව්වත්, අර්රුහානියත්, අස්සම් ඉය්‍යාත්)

1.2 *අකීදාවේ කොටස්* :
අහුලුස්සුන්න වල්ජමා අත්හි අකීදා
අනිකුත් අකීදා කොටස් කිහිපයක් ජබරිය්‍යා, කදිරිය්‍යා, මුර්ජියා, මුඃතසිලා, ෂියා

1.3 *තෞහිද් හා ෂිර්ක්කු* :
ඊමාන් හා කුප්රු
රිද්දත්, නිපාක්
අල්කුරාණය පහළ කර එය සම්පාදනය කරන ලද ආකාරය පිළිබඳ ඉතිහාසය
නීති මූලධර්මයන් වශයෙන් අල්කුරාණයේ උපයෝජනය
සුන්නාවේ බිහිවීම හා එය සම්පාදනය කළ ඉතිහාසය
නෛතික මූලධර්ම වශයෙන් සුන්නාවේ උපයෝජනය
හදීස් කලා ඉතිහාසය හා ප්‍රධාන මුහද්දීස්වරුන්ගේ දායකත්වය
ඉජ්තිහාද් පිළිබඳ විස්තර
ආධාරක මූලධර්මයන් වශයෙන් ඉජ්මා
ආධාරක මූලධර්මයන් වශයෙන් කියාස්
පික්හයේ ඉතිහාසය හා ප්‍රධාන ඉමාම්වරු

1.4 *අරාබි භාෂාව* :
හැඩහුරු සහිතව ලිවීම
කුඩා වාක්‍යයන් ලිවීම
ඉස්ලාම් විෂයයට අදාළ අරාබි වචන ලිවීම
ප්‍රධාන සූරා, ආයත්, හදීස් ආදිය නිවැරදිව ලිවීම

*දෙවන ප්‍රශ්න පත්‍රය* :

2. *අල්පික්හුල් ඉස්ලාම් නීති පද්ධතිය* :

2.1 *ඉබාදත් පිළිබඳ විස්තර* :
ඉබාදතයේ කොටස්
තහාරත්

2.2 *නජීසය හා එහි කොටස්* :
නජීසය පිරිසිදු කිරීමේ ක්‍රම
ජලය හා එහි වර්ග
වුලු, තයම්මුම්, ස්නානය පිළිබඳ පවතින ක්‍රියාදාමයන්

2.3 *සකාත්* :
වැදගත්කම
විධි හා ක්‍රම
එක්රැස් කිරීම හා බෙදා හැරීම

2.4 *නෝම්බිය (උපවාසය)* :
වැදගත්කම
විධික්‍රම හා ප්‍රයෝජන

2.5 *හජ්* :
වැදගත්කම
විධි ක්‍රම හා ප්‍රයෝජන

2.6 *හජ් ඉටු කරන ක්‍රමය* :
පර්ලු වාජිබ් සුන්නත්
පර්ලු හජ් යට අමතරව ඉටුකරන හජ්

2.7 ඉස්ලාම්හි ආහාර, ඇඳුම්, වාසස්ථාන පිළිබඳ අවධානය හා ක්‍රියාදාමයන්

2.8 ප්‍රගාත් පිළිබඳ පැහැදිලි කිරීම

2.9 කුර්බානි හා කැපුම් ක්‍රමයන්

2.10 දිවිරුම හා භාරවීම

2.11 *මුආමලාත් පිළිබඳ විස්තර* :
ඉපයීමේ වැදගත්කම
ප්‍රධාන ගණුදෙනු (වෙළඳාම)
අනිකුත් ගණුදෙනු (*උදා.* තාවකාලිකව ඉල්ලා ගැනීම, බදු ගැනීම)
වක්පු, වසීය්‍යත්, වරාසත් (පොදු දේපළ, බුදල් දේපළ, පරම්පරා දේපළ)

2.12 *ඉස්ලාම්හි ස්ත්‍රී පුරුෂ තත්ත්වයන්* :
නිකාහයේ විධි හා ප්‍රයෝජන
පවුල් ජීවිතය
අඹුසැමියන්
දෙමාපිය, දූදරු අයිතිවාසිකම් හා යුතුකම් තලාක් හා ඉද්දා

2.13 *ජිනායත්* :
හුදුද්, කියාස්, තඃසීර්

*තුන්වන ප්‍රශ්න පත්‍රය*

3. *සීරා හා තාරිකු*

3.1 ඉස්ලාමයට පෙර වූ අරාබි රටේ සමාජ ආගමික තත්ත්වයන්

3.1.1 *නබි(සල්) තුමා* :

*නුබුව්වතයට පෙර ජීවිතය*

පවුල, පරම්පරාව

තරුණ විය

උතුම් ගුණාංග

විවාහය

*නුබුව්වත් හා හිජ්රත් අතර ජීවිතය*

නුබුව්වත් ලැබීම

ඉස්ලාමික ප්‍රචාරයන් හා එහි ප්‍රතිඵල

මිඃරාජ්

හිජ්රත්

*මදීනා ජීවිතය*

සමාජ දේශපාලන ක්‍රියාකාරකම්

ආත්මාරක්ෂා යුද්ධයන් හා සාම ගිවිසුම්

ඉස්ලාම් සම්පූර්ණවීම

සහාබාවරුන්ගේ තත්ත්වයන් හා ඉස්ලාමය වෙනුවෙන් එතුමන්ලාගේ දායකත්වයන්

කුලපාඋර්රා සීදුන් යන අයගේ ඉතිහාසය හා දේශපාලන දායකත්වයන්

උමය්යා අබ්බාසිය්යා පාලන කාලය

බයිතුල් මුකද්දසයේ ඉතිහාසය

ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා දායකත්වය

මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන දායකත්වය

පහත සඳහන් අය පිළිබඳ ඉතිහාසය :

ඉමාම් බුහාරි (රහ්)

ඉමාම් ෂාපිර් (රහ්)

ඉමාම් ගස්සාලි (රහ්)

ඉමාම් අබ්දුල් කාදර් ජීලාන් (රහ්)

ඉමාම් ෂාදුලි (රහ්)

*හතරවන ප්‍රශ්න පත්‍රය*

4. අක්ලාක් - (ඉස්ලාම් සාර ධර්මය)

4.1 *අක්ලාක් පිළිබඳ ඉස්ලාමයේ අවධානය* :

අක් ලාක් පිළිබඳ විස්තර

ඊමාන් අක්ලා අතර පවතින සම්බන්ධතාවය

අක්ලා හා ඉබාදත් අතර තිබෙන සම්බන්ධතාවය

හෘද පවිත්‍රත්වය (ඉක්ලාස්)

4.2 *තක්වා* :

වරඋසුන්ද්

මුරාකබා, මුහාසපා

ෂමුක් (දේවකරුණාව)

4.3 *දන්දීම* :

කැපවීම

කෘතඥභාවය

ඉවසීම, නික්මීම, ඉඩදීම, සමාවීම

බැගෑපත්වීම

කාලය අගය කිරීම

අවයවයන් රැකගැනීම කට, ඇස, කණ, ලිංගික අංගයන්

අන් අයට ගෞරව කිරීම

යුක්තිය හා අවංකභාවය

තරුණ තරුණියන් අතර දක්නට ලැබිය යුතු වැදගත් සදාචාර ගුණාංගයන්

අනිකුත් ආගමික අය අතර වූ සහජීවනය

4.4 ඉස්ලාම් නීති පද්ධතිය

*ඇමුණුම - 02*

*අදාළ දිස්ත්‍රික්කවල විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට බලාපොරොත්තුවන නගර හා නගර අංක*

| *නගරය* | *නගර අංකය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය | | 01 |
| මැද කොළඹ | 01 | |
| බම්බලපිටිය | 02 | |
| ගම්පහ දිස්ත්‍රික්කය | | 02 |
| තිහාරිය | 03 | |
| මාබෝල | 04 | |
| මල්වාන | 05 | |
| මීගමුව | 06 | |
| කළුතර දිස්ත්‍රික්කය | | 03 |
| පානදුර | 07 | |
| කළුතර | 08 | |
| අලුත්ගම | 09 | |
| ගාල්ල දිස්ත්‍රික්කය | | 04 |
| ගාල්ල | 10 | |
| මාතර දිස්ත්‍රික්කය | | 05 |
| වැලිගම | 11 | |
| මාතර | 12 | |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | | 06 |
| හම්බන්තොට | 13 | |
| කෑගල්ල දිස්ත්‍රික්කය | | 07 |
| මාවනැල්ල | 14 | |
| වරකාපොල | 15 | |
| කන්නත්තොට | 16 | |
| කුරුණෑගල දිස්ත්‍රික්කය | | 08 |
| කුලියාපිටිය | 17 | |
| කුරුණෑගල | 18 | |
| මැල්සිරිපුර | 19 | |
| පොල්ගහවෙල | 20 | |
| පුත්තලම දිස්ත්‍රික්කය | | 09 |
| නොරොච්චෝලෙයි | 21 | |
| පුත්තලම | 22 | |
| හලාවත | 23 | |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | | 10 |
| අනුරාධපුරය | 24 | |
| කැකිරාව | 25 | |
| ගලෙන්බිඳුණුවැව | 26 | |

| *නගරය* | *නගර අංකය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|---|
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | 11 |
| කදුරුවෙල | 27 | |
| මාතලේ දිස්ත්‍රික්කය | | 12 |
| මාතලේ | 28 | |
| මහනුවර දිස්ත්‍රික්කය | | 13 |
| මහනුවර | 29 | |
| නාවලපිටිය | 30 | |
| දෙල්තොට | 31 | |
| ගෙලිඔය | 32 | |
| නුවරඑළිය දිස්ත්‍රික්කය | | 14 |
| නුවරඑළිය | 33 | |
| රත්නපුර දිස්ත්‍රික්කය | | 15 |
| ඇහැලියගොඩ | 34 | |
| බලංගොඩ | 35 | |
| බදුල්ල දිස්ත්‍රික්කය | | 16 |
| බදුල්ල | 36 | |
| වැලිමඩ | 37 | |
| මොණරාගල දිස්ත්‍රික්කය | | 17 |
| බිබිල | 38 | |
| අම්පාර දිස්ත්‍රික්කය | | 18 |
| අක්කරෙයිපත්තුව | 39 | |
| පොතුවිල් | 40 | |
| කල්මුනේ | 41 | |
| සමන්තුරේ | 42 | |
| මඩකලපුව දිස්ත්‍රික්කය | | 19 |
| කාත්තාන්කුඩි | 43 | |
| එරාවුර් | 44 | |
| වාලච්චේන | 45 | |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | | 20 |
| මුතූර් | 46 | |
| කින්නියා | 47 | |
| ත්‍රිකුණාමලය | 48 | |
| වවුනියාව දිස්ත්‍රික්කය | | 21 |
| වවුනියාව | 49 | |
| මන්නාරම දිස්ත්‍රික්කය | | 22 |
| මන්නාරම | 50 | |
| මුලතිවු දිස්ත්‍රික්කය | | 23 |
| මුලතිවු | 51 | |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | | 24 |
| කිලිනොච්චිය | 52 | |
| යාපනය දිස්ත්‍රික්කය | | 25 |
| යාපනය | 53 | |

*ඇමුණුම් - 03*

**විභාගය සඳහා වූ විෂයයන් හා විෂය නිර්දේශය**
(2004 වසරේ සිට පැවැත්වෙන විභාගවලට අදාල)

මෙකී විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයක්ම පැය තුනක කාලයක ප්‍රශ්න පත්‍ර වන අතර එවැනි ප්‍රශ්න පත්‍ර හතරකින් යුක්තය :

*1 පළමුවන ප්‍රශ්න පත්‍රය* - අකීදා හා ෂරීආ (ඉස්ලාම් සිද්ධාන්ත හා ක්‍රියාදාමයන් මූලිකාංග) හා අරාබි භාෂාව

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තය.

*1 වන කොටස - සෘජු (Objective) ප්‍රශ්න (ලකුණු 20)*

ඉස්ලාම් මූලික සිද්ධාන්ත, ප්‍රධාන මූලිකාංග හා නෛතික මූලධර්මයන් හඳුනාගැනීම.

අ. අර්කානුල් ඊමාන්
ආ. අකීදාවේ කොටස්
ඉ. අල්කුරාණය
ඊ. අල් හදීසය

මෙම කොටසට අයත් සියළුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතුවේ.

11 අ. කෙටි උත්තර සැපයීම - ප්‍රශ්න දහයක් (ලකුණු 10)
ආ. බහුවරණ ප්‍රශ්න - ප්‍රශ්න පහක් (ලකුණු 05)
ඇ. හිස්තැන් පිරවීම - ප්‍රශ්න පහක් (ලකුණු 05)

*11 කොටස - ව්‍යුහගත ප්‍රශ්න (ලකුණු 40)*

තව්හීද්හා එයට විරුද්ධ කරුණු උප මූලාංගයන් පැහැදිලිව විස්තර කිරීම

අ. තව්හීදය හා එහි වර්ගයන්
ආ. තව්හීදයට ප්‍රතිවිරුද්ධ ප්‍රතිපත්ති
ඇ. ඉජ්මාඋ හා කියාස්
ඈ. ඉජ්තිහාද් සහ මුජ්තහීද්වරු

මෙම කොටසට අයත් ප්‍රශ්න හතරකින් කැමති ප්‍රශ්න දෙකකට උත්තර සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයකම අ. ආ. ඇ. ඈ. යන ප්‍රශ්න කොටස් හතරක් ඇත. එහි එක් කොටසක ප්‍රශ්නයකට ලකුණු 05 බැගින් (4x5=20) ලකුණු දෙනු ලැබේ.

*111 කොටස රචනාත්මක ප්‍රශ්න (ලකුණු 40)*

නෛතික මූලධර්මවල ප්‍රායෝගිකත්වය හා ඒවා පිළිපැදීම

(අ) අල්කුරාන් අල්හදීස් ඉතිහාසය
(ආ) අල්කුරානයේ ප්‍රධාන සූරා හා සූරාවට අදාළ අරාබි වචන අරාබි භාෂාවෙන් ලිවීම
(ඇ) ප්‍රධාන මද්හබ් සතර හා ඒවායේ ඉමාම්වරුන්
(ඈ) ඉජ්තිහාද් හා අනිකුත් මුජ්තහිද්වරුන්

මෙම කොටසේ දෙනු ලබන ප්‍රශ්න හතරින් කැමති ප්‍රශ්න දෙකකට උත්තර සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක්ම දැනුම, කුසලතාව, ආකල්ප ආදිය ගැන ඇගයීම් කළහැකි ආකාරයේ රචනාමය පිළිතුරු දියයුතු ප්‍රශ්න වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලබාදිය හැක.

*2 දෙවන ප්‍රශ්න පත්‍රය - අල්ෆික්හුල් ඉස්ලාම් (ඉස්ලාම් නීති මාලාව)*

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තය.

1 කොටස - සෘජු ප්‍රශ්න (Objective 40) ප්‍රශ්න (ලකුණු 20 යි)

පංචමහ යුතුකම් සහ අනිකුත් එදිනෙදා කටයුතු ඉබාදත් වශයෙන් යොදා ගැනීම :

(අ) තහාරත් හා නජීසය
(ආ) පංච මහ යුතුකම්
(ඇ) අනිකුත් ඉබාදත්

මෙම කොටසට අයත් සියළු ප්‍රශ්න වලට උත්තර දිය යුතුය.

1 (අ) පොදු උත්තර සැපයීම - ප්‍රශ්න දහයයි (ලකුණු 10)
(ආ) බහුවරණ ප්‍රශ්න - ප්‍රශ්න පහයි (ලකුණු 05)
(ඇ) හිස්තැන් පිරවීම - ප්‍රශ්න පහයි (ලකුණු 05)

11 කොටස - ව්‍යුහගත ප්‍රශ්න (ලකුණු 40)

මුආමලාත්, මුනාකබාත්, ජිනායාත් ආදී ක්‍රියාකාරකම් ඉබාදත් කර ගැනීම

(අ) පංච මහයුතුකම්
(ආ) අනිකුත් සුන්නත් ඉබාදත්
(ඇ) විවාහ හා පවුල් ජීවිතය
(ඈ) මුආමලාත්
(ඉ) ජිනායාත්

මෙම කොටසේ ඇති ප්‍රශ්න හතරෙන් කැමති ප්‍රශ්න දෙකකට උත්තර දිය යුතුවේ. සෑම ප්‍රශ්නයකම අ, ආ, ඇ, ඈ යනු කොටස් හතරක් ඇත. එක් ප්‍රශ්න කොටසකට ලකුණු 05 බැගින් (4x5=20) ලකුණු ලැබේ.

111 කොටස රචනාගත ප්‍රශ්න - (ලකුණු 40)

පර්ලු, සුන්නත්, ඉබාදත්වල ප්‍රයෝජනයන් හා දර්ශනයන් දැනගෙන ක්‍රියාකිරීම

අ. පංච මහ යුතුකම්
ආ. ව්‍යාතිමය කටයුතු
ඇ. වැරදි හා දඬුවම්
ඈ. විවාහය හා පවුල් ජීවිතය

මෙම කොටසේ දෙනු ලබන ප්‍රශ්න හතරෙන් කැමති ප්‍රශ්න දෙකකට උත්තර දිය යුතුය. සෑම ප්‍රශ්නයක්ම දැනුම කුසලතා ආකල්ප ඇගයීමට ලක්කළ හැකි රචනාත්මක උත්තර දියයුතු ප්‍රශ්න වේ. එකී ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් දෙනු ලැබේ.

*3 තුන්වන ප්‍රශ්න පත්‍රය - සීරා හා තාරීක්කු*

නබි (සල්) තුමාගේ ඉතිහාසය හා අනිකුත් ඉතිහාස

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තය.

1 කොටස සෘජු ප්‍රශ්න (ලකුණු 20)

නබි(සල්) තුමාගේ හා සහබාවරුන්ගේ හා අනිකුත් ඉතිහාස දැනගැනීම

(අ) ජාහිලියා කාලයේ ආගමික සමාජතත්වය
(ආ) නබි (සල්) තුමාගේ ජීවිත ඉතිහාසය
(ඇ) සහාබාවරුන් ඉස්ලාමයට කල දායකත්වය
(ඈ) උමයියා අබ්බාසියා කාලයන්

මෙම කොටසේ ප්‍රශ්න වලට සියළුම විභාග අයදුම්කරුවන් උත්තර සැපයීම අවශ්‍යයය. මෙම ප්‍රශ්නය කොටස් තුනකින් යුක්තය.

1 (අ) කෙටි උත්තර සැපයීම - ප්‍රශ්න දහයයි (ලකුණු 10)
(ආ) බහුවරණ ප්‍රශ්න - ප්‍රශ්න පහයි (ලකුණු 05)
(ඇ) හිස්තැන් පිරවීම - ප්‍රශ්න පහයි (ලකුණු 05)
(සම්පූර්ණ ලකුණු 20)

11 කොටස ව්‍යුහගත ප්‍රශ්න - ලකුණු 40

අ. නබි(සල්) තුමාගේ මක්කා ජීවිතය
ආ. නබි(සල්) තුමාගේ මදීනා ජීවිතය
ඇ. කුලපාඋර්රාසිදූන්වරුන්ගේ ඉතිහාසය
ඈ. විවිධ ගෝත්‍රවලට අයත් ඉමාම්වරුන්ගේ දායකත්වයන්
ඉ. බයිතුල් මුකද්දාස්

මෙම කොටසේ දෙනු ලබන ප්‍රශ්න හතරෙන් කිසියම් ප්‍රශ්න දෙකකට උත්තර සැපයිය යුතු වේ. සෑම ප්‍රශ්නයක්ම අ, ආ, ඇ, ඈ, යන කොටස් හතරකින් යුක්තය. එක් කොටසකට ලකුණු 05 බැගින් දෙනු ලැබේ. (5x4=20)

111 කොටස රචනාගත ප්‍රශ්න ලකුණු 40

නබි (සල්) තුමා විසින් පෙන්වා දෙන ලද ඉස්ලාම් සමාජීය දේශපාලන අවශ්‍යතාවයන් ගැන අවබෝධ කිරීම.

අ. නබි (සල්) තුමාගේ ජීවිත ඉතිහාසය
ආ. අල්කුල පා උර්රාෂිදූන්වරුන්ගේ දේශපාලන දායකත්වය
ඇ. ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා කැපවීම
ඈ. මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනික දායකත්වය

මෙම කොටසට අයත් ප්‍රශ්න හතරෙන් යම්කිසි ප්‍රශ්න දෙකකට උත්තර සැපයිය යුතුවේ. ලකුණු 20ක් බැගින් දෙනු ලැබේ.

(මුළු ලකුණු 5x20=100)

10-677

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2007

*ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය*

01. කතෝලික යොවුන් දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය ලෙස හඳුන්වනු ලබන මෙම විභාගය 2007 වසරේ සිට වාර්ෂිකව දිවයින පුරා පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

02. *විභාග මධ්‍යස්ථාන*:- දිවයින තුළ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන ලෙස අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එකී විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි විභාග මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට සිදුවනු ඇත. විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන දිස්ත්‍රික්ක හා නගර දැක්වෙන ලැයිස්තුව 1 වන උපලේඛනයේ දක්වා ඇත.

03. *භාෂා මාධ්‍යය*:- මෙම විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

04. *සුදුසුකම්* :-මෙම විභාගය සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකු ම පහත දක්වා ඇති සුදුසුකම් අතරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1 කතෝලික දහම් පාසලක 10 වන ශ්‍රේණිය සමත්වී දහම් පාසල් අවසාන සහතික පත්‍ර පන්තියේ යටත් පිරිසෙයින් වර්ෂයක් හෝ ඉගෙනුම් කටයුතුවල නිරතවීම.

4.2 ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙළ) විභාගයෙන් කතෝලික ධර්මය (ක්‍රිස්තු ධර්මය රෝ. ක.) විෂයයෙන් සමත්ව සිටීම හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් කතෝලික ධර්මය (ක්‍රිස්තු ධර්මය රෝ. ක) විෂයයෙන් සමත්ව සිටීම.

4.3 ඒ ඒ රදගුරුවසම්වල පවත්වන වාර්ෂික ධර්මෝපදේශ විභාගයේ එකොළොස්වන වසර සමත්වීම.

*සටහන* : i. මෙම විභාගය සඳහා ඉදිරිපත් වන සෑම අයදුම්කරුවකු ම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට දහම් පාසල් ප්‍රධානාචාර්යවරයකු හෝ මීසම්භාර පූජාප්‍රසාදිතුමකු හෝ විසින් සහතික කළ යුතුය.

ii. විභාගාපේක්ෂකයන්ට මෙම විභාගය සඳහා ඉදිරිපත් විය හැක්කේ දහම් පාසල් අයදුම්කරුවකු වශයෙන් පමණකි.

05. *අයදුම් කිරීම* :-

5.1 කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සඳහා විභාග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ සියලුම දහම් පාසල්වලට අවශ්‍ය ඉල්ලුම් පත්‍ර සහ උපදෙස් පත්‍රිකා යථා කාලයේ දී සපයනු ලැබේ. නියමිත දින වකවානු තුළ ඉල්ලුම්පත්‍ර නොලැබුණොහොත්, දහම් පාසලේ නම, ලිපිනය, ඉදිරිපත් කරන අයදුම්කරුවන් සංඛ්‍යාව යන විස්තර සඳහන් ලිපියක් 5.6 ඡේදයේ සඳහන් ලිපිනයට 2007.11.02 වැනි දිනට පෙර දැන්විය යුතුය.

5.2 කවර හෝ අයදුම්කරුවකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේ වුවත් 4 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාගාපේක්ෂකයකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මගින් රුපියල් 60ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම දහම් පාසල් වෙත ලබාදෙනු ඇත.

5.3 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින් ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සකස්කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත යැවිය යුතුය. දෙවන පිටපත දහම් පාසල් ප්‍රධානියා වෙත තබාගත යුතුය. අයදුම්පත්‍ර දෙකෙහි ම ප්‍රධානාචාර්යවරයා අත්සන් තබා තිබිය යුතුය.

5.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2007.11.16 වැනි දින වේ.

5.5 අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.6 දහම් පාසලේ ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතුය. දුරකථන පහසුකම් ඇත්නම් එම අංකය ද සඳහන් කරන්න. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ලැබුන බව දන්වා එවනු නොලැබේ :

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

අයදුම්පත් බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය (අදාළ වර්ෂය)" යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතුය. කිසිම සහතිකයක් අයදුම්පත් සමග අමුණා එවීම අවශ්‍ය නොවේ.

5.7 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන විදුහල්පතිවරයා හෝ පූජාප්‍රසාදිතුමා හෝ වගකිය යුතුය.

06. *විභාග ගාස්තු* :-මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 60 කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ.

6.1 *විභාග ගාස්තු ගෙවීම* :- විදුහල්පතිතුමා විසින් විභාග ගාස්තු ගෙවිය යුතු සියලුම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතුකොට දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට එම මුදල ගෙවා ලදුපතක් ලබාගෙන එම ලදුපත අයදුම් පත්‍රයේ පසු පිටේ නොගැලවෙනසේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. (මුද්දර හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.)

6.2 *විභාග ගාස්තු ආපසු ගෙවීම* :-කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

07. *ප්‍රවේශ පත්‍ර* :- විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවකු වෙතම, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, ඉල්ලුම්පත් ඉදිරිපත් කළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා මගින් නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින් ම ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත භාරදිය යුතුය. යම් අයදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටිනම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටීනම් ඔහුගේ හෝ ඇයගේ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා හෝ මීසම් භාර පූජාප්‍රසාදිතුමා හෝ සහතික කළ යුතුය.

7.3 විභාග පැවැත්වීමට දින 07කට පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම දහම් පාසලේ ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතුය. එවැනි සෑම අවස්ථාවක ම පහත සඳහන් විස්තර සැපයිය යුතුය :

1. විභාගයේ නම ;
2. දහම් පාසලේ නම ;
3. සම්පූර්ණ නම සහ ලිපිනය ;
4. ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය/නගරය ;
5. ඉල්ලුම්පත්‍ර තැපැල් කළ තැපැල් කාර්යාලය ;
6. ලිපිය ලියාපදිංචි කළ අංකය හා දිනය ;
7. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපත් අංකය, දිනය සහ තැපැල් කාර්යාලය ;

08. *හැඳුනුම්පත*.– එක් එක් ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින සෑම අවස්ථාවක ම ශාලාධිපතිට පිළිගත හැකි පරිදි අපේක්ෂකයන් විසින් තමන්ගේ අනන්‍යතාව

ඔප්පු කිරීම සඳහා සූදානම්ව සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.

8.1. ජාතික හැඳුනුම්පත
8.2 වලංගු විදේශ ගමන් පත්‍රය

09. *සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.*– මෙම විභාගය සඳහා නියමිත ප්‍රශ්න පත්‍ර හතරක් වන අතර විභාගයෙන් සමත්වීමට සෑම අපේක්ෂකයකු ම එකම අවස්ථාවක දී ප්‍රශ්න පත්‍ර (විෂය) හතරෙන් ම සමත් විය යුතුය.

9.1 මෙම විභාගයේ දී ඌන සාමාර්ථය ප්‍රදානය කරනු නොලැබේ.

9.2 සෑම විෂයකට ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු 100 ක් හිමිවන අතර, සමත්වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ.

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ඨ සම්මාන | D |

9.3 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තු අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. *සහතික පත්‍ර.*– මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුට ම විභාග දෙපාර්තමේන්තුව මගින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ.

11. *උත්තර පත්‍ර නැවත සමීක්ෂණය*.- දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩ දෙනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාගයේ ප්‍රතිඵල නිකුත්වී දින 30ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. මෙම ගාස්තු ආපසු ගෙවනු ලබන්නේ මුලින් ම දෙන ලද ප්‍රතිඵලයක වෙනසක් කිරීමට සිදුවුවහොත් පමණි. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12. මෙම ව්‍යවස්ථාව සහ විෂය නිර්දේශ පත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලු ම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමතය පරිදි තීරණ වනු ඇත.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2007 ඔක්තෝබර් මස 05 වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

*කතෝලික ධර්මය*

(2007 සිට ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා විෂය නිර්දේශය)
මේ විභාගය පැය 03 බැගින් වූ ප්‍රශ්න පත්‍ර 04කින් සමන්විත ය.

I වන ප්‍රශ්න පත්‍රය

*කතෝලික විශ්වාසය*

(අ) මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණයේ එන මූලික ඉගැන්වීම් පදනම් වේ.

* මැවුම්කරුවාණෝ :
- විශ්වයේ ප්‍රභවය
- මැවිල්ලේ අසිරිය
- මැවිල්ල සුරැකීම (උත්පත්ති 1, 2, 3)

* ගැලවුම්කරුවාණෝ :
- ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ (ජොහන් 1:1-14)
- දේව රාජ්‍ය පිළිබඳ ඉගැන්වීම් (මතෙවු 5, 6, 7)
- උපමා (මතෙවු 13:1-52)
- ප්‍රාතිහාර්ය (ජොහන් 11:38-45, ලූක් 8:26-39, මාක් 2:1-12, මාක් 4:35-41)

* ශුද්ධාත්මයාණෝ :
- ක්‍රියාකාරිත්වය (ජොහන් 7:37-39, 14:15-31, 16:5-15, 1 කොරින්ති 12:4-11)

* කිතුනු සභාව :
- ඒකත්වය, ශුද්ධත්වය, සාධාරණත්වය සහ අපෝස්තලිකත්වය
- සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ලෙස

* රෝම 12:4-21

* 1 කොරින්ති 12:12-31

- සභාවේ පාලන සැලැස්ම
- නිල බලයලත් සේවය
- පැවිදි සේවාවන්
- ගිහි සේවාවන්

* රූපාන්තර පරිවර්තනය :
- මනුෂ්‍යාගේ අවසාන සිද්ධි
- අලුත් අහසක්, අලුත් පොළොවක් (එළිදරව්ව 21:1-4)

II වන ප්‍රශ්න පත්‍රය

*කතෝලික ජීවිත පැවැත්ම*

(අ) කතෝලික ජීවිත පැවැත්මට පන්නරය ලැබෙන ජනවන්දනාව

* දිව්‍ය පූජාව සහ පූජා පිළිවෙත
* පාස්කු අභිරහස
* දේව වරප්‍රසාද
* ප්‍රසාද නිධාන (පොදු ලක්ෂණ)

* ආරම්භ ප්‍රසාද නිධාන
- ප්‍රසාද ස්නාපනය
- අභිවෘද්ධි ආලේපය
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

* සුවය ලබාගැනීමේ ප්‍රසාද නිධාන
- සමගි සන්ධානය
- රෝගීන්ගේ ආලේපය

* සේවය සඳහා ස්ථාපිත ප්‍රසාද නිධාන
- පූජකවරය
- ආශිර්වාදකාර බන්ධනය.

III වන ප්‍රශ්න පත්‍රය

*කතෝලික සදාචාරාත්මක ජීවිතය*

(ඉ) කතෝලික සදාචාරය
* දස පනත සහ ප්‍රේමයේ පනතේ පැතිකඩ දෙක
* දස පනත පූර්ණත්වයට පත් කළ ක්‍රිස්තුන් වහන්සේ (මතෙව් 5:21-47)
* තැනිතලා ස්ථානයේ දේශනය (ලූක් 6:17-49)
* බුද්ධිය, නිදහස් කැමැත්ත සහ හැඟීම්
* දේව සම්බන්ධ ධර්ම ගුණ
* හෘද සාක්ෂිය
* දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම (1-3 පනත්)
* අසල්වැසියාට ප්‍රේම කිරීම (4-10 පනත්)
* දස පනත තුළින් මතුවිය යුතු සාරධර්ම
* කතෝලික අනන්‍යතාව

IV වන ප්‍රශ්න පත්‍රය

*යාච්ඤාවේ ජීවිතය*

(ඊ) දේව සබඳතා ගොඩ නැඟෙන යාච්ඤාව

* පුරාණ ගිවිසුමේ යාච්ඤාව
  - අබ්‍රහම්
  - මෝසෙස්

* නව ගිවිසුමේ යාච්ඤාව
  - ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළ විශේෂ අවස්ථා
  - යාච්ඤාව පිළිබඳ විශේෂ ඉගැන්වීම් (ලූක් 11:1-13)

* සභා ජීවිතය තුළ යාච්ඤාව
  - ප්‍රශංසාව
  - තුති පිදීම
  - යැදුම
  - මැදහත් යැදුම
  - භාවනාත්මක යාච්ඤාව

* ස්වාමිවාක් ආරාධනයේ ඉල්ලීම හත
  - ඔබගේ නාමයට ප්‍රශංසා වේවා
  - ඔබගේ රාජ්‍යය පැමිණේවා
  - ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් මොලොවෙහි ඉටුවේවා
  - අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව
  - අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව
  - පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදුන මැනව
  - අයහපතින් අප මුදාගත මැනව

* විවිධ භක්ති අභ්‍යාස
  - ජපමාලය
  - නුවාන
  - ශුද්ධ පැය



* පරිශීලනය කළ යුතු ග්‍රන්ථ
- නව කතෝලික ධර්මෝපදේශය
- මහෝපදේශය
- ශුද්ධ බයිබලය (නියමිත කොටස්)
- II වන වතිකාන ප්‍රකාශන

* ජනවන්දනාව
* වර්තමාන ලෝකයේ ශුද්ධ සභාව
* ක්‍රිස්තුන් වහන්සේගේ සභාව
* ගිහි ධර්මදූත සේවය

1. උපලේඛනය

*ඒ ඒ දිස්ත්‍රික්කයන්හි විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක*

*දිස්ත්‍රික්කය - 01 (කොළඹ)*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| බොරැල්ල | 0101 |
| කලුඅග්ගල | 0102 |
| පන්නිපිටිය | 0103 |
| මොරටුව | 0104 |

*දිස්ත්‍රික්කය - 02 (ගම්පහ)*

| | |
|---|---|
| මීගමුව | 0205 |
| කඳාන | 0206 |
| ගම්පහ | 0207 |
| රාගම | 0208 |

*දිස්ත්‍රික්කය - 03 (කළුතර)*

| | |
|---|---|
| කළුතර | 0309 |

*දිස්ත්‍රික්කය - 04 (ගාල්ල)*

| | |
|---|---|
| ගාල්ල | 0410 |

*දිස්ත්‍රික්කය - 05 (මාතර)*

| | |
|---|---|
| මාතර | 0511 |

*දිස්ත්‍රික්කය - 06 (හම්බන්තොට)*

| | |
|---|---|
| හම්බන්තොට | 0612 |

*දිස්ත්‍රික්කය - 07 (රත්නපුර)*

| | |
|---|---|
| රත්නපුර | 0713 |

*දිස්ත්‍රික්කය - 08 (කෑගල්ල)*

| | |
|---|---|
| කෑගල්ල | 0814 |

*දිස්ත්‍රික්කය - 09 (පුත්තලම)*

| | |
|---|---|
| පුත්තලම | 0915 |
| හලාවත | 0916 |
| වෙන්නප්පුව | 0917 |

*දිස්ත්‍රික්කය - 10 (කුරුණෑගල)*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කුරුණෑගල | 1018 |
| කුලියාපිටිය | 1019 |
| නිකවැරටිය | 1020 |

*දිස්ත්‍රික්කය - 11 (මහනුවර)*

| | |
|---|---|
| මහනුවර | 1121 |

*දිස්ත්‍රික්කය - 12 (මාතලේ)*

| | |
|---|---|
| මාතලේ | 1222 |

*දිස්ත්‍රික්කය - 13 (නුවරඑළිය)*

| | |
|---|---|
| තලවාකැලේ | 1323 |

*දිස්ත්‍රික්කය - 14 (බදුල්ල)*

| | |
|---|---|
| බදුල්ල | 1424 |

*දිස්ත්‍රික්කය - 15 (මොණරාගල)*

| | |
|---|---|
| මොණරාගල | 1525 |

*දිස්ත්‍රික්කය - 16 (අනුරාධපුරය)*

| | |
|---|---|
| අනුරාධපුරය | 1626 |

*දිස්ත්‍රික්කය - 17 (පොළොන්නරුව)*

| | |
|---|---|
| හිඟුරක්ගොඩ | 1727 |

*දිස්ත්‍රික්කය - 18 (ත්‍රිකුණාමලය)*

| | |
|---|---|
| ත්‍රිකුණාමලය | 1828 |

*දිස්ත්‍රික්කය - 19 (මඩකලපුව)*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මඩකලපුව | 1929 |

*දිස්ත්‍රික්කය - 20 (අම්පාර)*

| | |
|---|---|
| අම්පාර | 2030 |
| කල්මුනේ | 2031 |

*දිස්ත්‍රික්කය - 21 (යාපනය)*

| | |
|---|---|
| යාපනය | 2132 |
| මානිප්පායි | 2133 |
| පරුත්තිතුරෙ | 2134 |
| නෙඩුන්තිවු | 2135 |

*දිස්ත්‍රික්කය - 22 (මුලතිව්)*

| | |
|---|---|
| කිලිනොච්චිය | 2236 |
| මුලතිව් | 2237 |
| මුලංගාවිල් | 2238 |

*දිස්ත්‍රික්කය - 23 (මන්නාරම)*

| | |
|---|---|
| මන්නාරම | 2339 |
| මුරුංගන් | 2340 |
| ආන්ඩාංකුලම් | 2341 |
| පෙරිය පන්ඩිවිරිස්සාන් | 2342 |

*දිස්ත්‍රික්කය - 24 (වව්නියාව)*

| | |
|---|---|
| වව්නියාව | 2443 |

10–676

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.